12

# රටට හිතැති පුවත්පත් කලාවේදියා




ලංකාව ක්‍රි.ව 1815 සිට ක්‍රි.ව 1948 දක්වා මහා බ්‍රිතාන්‍යයේ යටත් රාජ්‍යයක් ලෙස පැවතිණ. එනම්, ලංකාව පාලනය කරන ලද්දේ මහා බ්‍රිතාන්‍යය විසිනි. මෙකල ලංකාව නිදහස් කර ගැනීමේ අවශ්‍යතාව ලාංකිකයන්ට දැනිණ. ඔවුහු ඒ සඳහා විවිධ ක්‍රියා මාර්ග ගත්හ. සටන්, උද්ඝෝෂණ, අරගල ආදිය ඒ අතර වේ. නිදහස් අරගලයේ පණිවිඩය පුවත්පත් මඟින් ගෙයින් ගෙට ගෙන ගිය රටට හිතවත් අයෙක් නම් ඩී.ආර්. විජේවර්ධන හෙවත් දෙන් රිචඩ් විජේවර්ධන මහතා ය.

දොන් රිචඩ් විජේවර්ධන ක්‍රි.ව. 1886 පෙබරවාරි 23 දින සේදවත්තේ දී උපත ලැබී ය. ඔහුගේ පියා දෙන් පිලිප් විජේවර්ධන මුහන්දිරම් ය.

දෝන හෙලේනා විජේවර්ධන ඔහුගේ මව වූවා ය. ඩී.ආර්. විජේවර්ධන කොළඹ ශාන්ත තෝමස් විද්‍යාලයේ ඉගෙනුම ලැබුවේ ය. පසු ව ඔහු එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ඇතුළත් වී උසස් අධ්‍යාපනය ලැබී ය. ඔහු එහි දී එල්.එල්.බී. උපාධිය සමත් වී අධිනීතිඥයෙකු බවට පත් විය.

ඩී.ආර්. විජේවර්ධන මහතා ලංකාවට පැමිණ සුළු කාලයක් කොළඹ අලුත්කඩේ උසාවියේ නීතිඥයකු ලෙස කටයුතු කළේ ය. පසු ව එයින් ඉවත් වූ ඔහු දේශපාලන කටයුතුවලට සම්බන්ධ විය. ඔහු විවිධ රැස්වීම්, කණ්ඩායම් සංවිධානය කළේ ය. ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් දේශන පැවැත්වීය. ඔහු මේ සියල්ලෙන් ම බලාපොරොත්තු වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් ලංකාව නිදහස් කර ගැනීමයි.

එකල පැවති පුවත්පත් සියල්ල ම අධිරාජ්‍ය ගැති විය. රට නිදහස් කර ගැනීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නම් දිනපතා පළවන පුවත්පතක්වත් පැවතිය යුතු බව එතුමා තේරුම් ගත්තේ ය. මේ නිසා "දිනමිණ" පුවත්පතේ අයිතිය එතුමා මිලට ගත්තේ ය. "සීලනීස්" නම් ඉංග්‍රීසි පුවත්පතේ අයිතිය ද මිලට ගත් එතුමා එය "ඩේලි නිවුස්" නමින් ප්‍රසිද්ධ කළේ ය. මින් පසු ව එතුමා මෙම පුවත්පත් දෙක මගින් රට නිදහස් කර ගැනීම පිළිබඳ මතය ජනතාව අතරට ගෙන යාමට කටයුතු කළේ ය. රටට නිදහස ලබා ගැනීමේ දී එම පුවත්පත් මගින් ඉටු කළ සේවය බොහෝ සේ වැදගත් විය. පසු ව එතුමා තම පුවත්පත් ආයතනය "ලේක්හවුස්" ආයතනය නමින් පිහිටුවූවේ ය.

යම් කිසිවෙක් එක් අවස්ථාවක දී "ඩී. ආර්. විජේවර්ධන මහතා රටට ඉටු කළ සේවය කුමක් ද?" යි මාර්ටින් වික්‍රමසිංහ පඬිවරයාගෙන් විමසී ය. ඊට එතුමා දුන් පිළිතුර වූයේ, "ඩී.ආර්. විජේවර්ධන මහතා රටට හිතවත් අයෙකු ලෙස මා හඳුන්වන්නේ ඇයි ද යි සමහරුන්ට ගැටලුවකි. ඒ මහතා රටට හිතැති අයෙකු වූයේ කතාවෙන් නොව ක්‍රියාවෙනි. ඔහු රට, ජාතිය වෙනුවෙන් කියූ දේ නොව කළ දේ සෙවීමෙන් ඒ බව පැහැදිලි වේ" යනුවෙනි.

## ක්‍රියාකාරකම්

01). විරාම ලකුණු කෙරෙහි නිසි අවධානය යොමු කරමින් පාඩම නැවත කියවන්න.

02). පහත සඳහන් යෙදුම්වලට අවශ්‍ය විරාම ලකුණු නිවැරදි ව යොදන්න.

i ඊ ඩබ්ලිව් පෙරේරා
ii ඩී බී ජයතිලක
iii ආචාර්ය එල් ටී පී මංජු ශ්‍රී
iv ශ්‍රීමත් පී රාමනාදන්
v එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක

### භාෂා භාවිතය

01). පහත සඳහන් වාක්‍ය ඛණ්ඩ නිවැරදි විරාම ලක්ෂණ සහිත ව කෙටිකොට නැවත ලියන්න.

උදහරණ: ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ල.දු.දෙ.

i ලංකා ගමනාගමන මණ්ඩලය

ii අගනුවර තරුණ කවි සමාජය

iii අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

iv සමුපකාර තොග වෙළඳ සංස්ථාව

v ජනතා වතු සංවර්ධන මණ්ඩලය

02). පහත සඳහන් විරාම ලකුණු සහිත ව කෙටියෙන් දැක්වෙන අකුරුවලින් කියවෙන සම්පූර්ණ වචන ලියා දක්වන්න. එම වාක්‍යාංශ ඇතුළත් කොට අර්ථවත් වාක්‍ය ගොඩනගන්න.

උදහරණ: එ.ජා.ස. = එක්සත් ජාතීන්ගේ සංවිධානය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ
නියෝජිතයෙක් ඊයේ ලංකාවට පැමිණියේ ය.

- i ගො.දු.ස.
- ii ශ්‍රී.ල.තැ.දෙ.
- iii ක්‍රි.ව.
- iv රා.සේ.පි.
- v ලං.වි.ම.

03). සුදුසු පරිදි විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

i ඔබේ නම කුමක් ද

ii අනේ මාව බේරා ගන්න යැයි ගඟට වැටුණු මිනිසා කෑගැසී ය

iii ඩී ආර් විජේවර්ධන මහතා විදේශ විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබා එල් එල් බී උපාධිය සමත් ව අධිනීතිඥයෙකු බවට පත් විය

iv මොනවා උඹ එහෙ ගියේදැ යි ඔහු කෝපයෙන් විචාළේ ය

v නෑ මං එහෙ ගියේ නෑ යි නිමල් පිළිතුරු දුන්නේ ය

04). පහත සඳහන් දෙබසෙහි සුදුසු තැන්වල “ ” . , ! ? යන විරාම ලකුණු යොද ඔබගේ අභ්‍යාස පොතෙහි ලියන්න.

අනේ නෝනා මං මෙහේ ආවේ නැත්තේ මගේ දුව අසනිප වුණ හින්ද දූන් කොහොම ද

ඔව් නෝනට පිං සිද්ධ වෙන්න මගේ දුව මේ පාර සනීප කර ගත්තා නෝනා කරන උදවු මං උප උපන් ජාතියේ සිහි කරනවා

ඇයි ඉතිං දුව එක්කරගෙන ආවේ නැත්තේ අවුරුද්දට

අනේ නෝනා තව ම එයාට හොඳට ම සනීප වෙලා නෑ දොස්තර මහත්තයා කිව්වා තව ටික දවසක් ප්‍රවේශමෙන් ඉන්න කියලා

**පැවරුම්**

01). ඔබ කැමති ජාතික වීරයෙකු පිළිබඳ ව වචන සියයක පමණ කෙටි රචනාවක් ලියන්න. එම රචනාවෙහි අදාළ තැන්වලට “ ” . , යන විරාම ලක්ෂණ යොදන්න.

02). පද බෙදූ ඇති ආකාරය ගැන අවධානය යොමු කරමින් පාඩමෙහි මුල් ඡේද තුන නැවත කියවන්න. පහත දැක්වෙන ඡේදය නිවැරදි ව පද බෙද ඔබගේ අභ්‍යාස පොතෙහි ලියන්න.

ළමයිපිරිස වැඩිහිටියන් සමඟ රත්ගල්කන්ද නැගීමට මහත් ආශාවෙන් පසුවූහ. ඉන්පසු ව ඔවුහු සියලුදෙනා ම කඳු නැගීමේ දී රැගෙන ආයුතුදේ පිළිබඳ ව සාකච්ඡා කළහ. දිවාආහාරය සඳහා බත් පාර්සල් හා අනෙකුත් අවශ්‍යදේ රැගෙන යාමටත් තීරණය කෙරිණි. එදින රාත්‍රි නිඳි යහනේදී අසංක ගමන පිළිබඳව දිගින් දිගට ම සිතුවේ ය. මේ ගමනේදී කිසියම් දෙයක් අලුතින් ඉගෙනගැනීමට ඔහු තීරණය කළේ ය.

03). අතිරේක කියවීම

# මාර්ටින් වික්‍රමසිංහ

1890 මැයි 29 දින මාර්ටින් වික්‍රමසිංහ මහතා උපත ලැබී ය. කොග්ගල, මලලගම ළමා හේවගේ දොන් බස්තියන් වික්‍රමසිංහ මොහුගේ පියා වන අතර මාගාල්ලෙ බලපිටියේ ලියනගේ නොච්චිහාමි මව වූවා ය.

1895 දී අන්දිරිස් ගුරුන්නාසේගෙන් අකුරු ඉගෙනීම මුලින් ම කළ අතර 1897 දී ගමේ පන්සලෙන් ඉගෙනුම ලැබුවේ ය. ඉන්පසුව ඔහු 1900 දී ගාල්ලේ බොනවිස්ටා පාසලට ඇතුළු විය. 1902 වන විට පියාගේ අභාවයත් සමග ආර්ථික අපහසුකම් වැඩිවීම නිසා පාසලෙන් අස්වී කොග්ගල ධීරානන්ද හිමියන් වෙතින් සිංහල, පාලි, සංස්කෘත ඉගෙන ගත්තේ ය. මෙම කාලය තුළ දී “බාලෝපදේශය” නමැති මෙතුමාගේ පළමු ග්‍රන්ථය පළ කෙරුණි.

1904 දී නැවත අහංගම සිංහල පාසලට ගිය ඔහු 1906 දී නැවතත් පාසලෙන් අස්වී කොළඹ කරෝලිස් සිල්වා සාප්පුවේ ලියන්නෙකු ලෙස රැකියාවක් කළේ ය.

“මගේ කය වැඩුණේ අනිත් සිංහල ගැමියෙකුගේ කය වැඩුනාක් මෙනි. සිත වැඩුණේ වෙනස් විධියකිනි. උසස් විදුහලකින් හෝ පඬිවරයෙකුගෙන් හෝ පිළිවෙළින් උගැන්මක් නොලත් මා දැනුම ලැබුවේ අත්දැකීමෙන් හා ආසාවෙන් පොත් කියවීමෙනි”

“උපන්දා සිට” කෘතියෙහි මාර්ටින් වික්‍රමසිංහ තම අධ්‍යාපනය පිළිබඳ ව සටහන් කොට ඇත්තේ ඒ අයුරිනි. සැබවින් ම හරි හැටි පාසල් අධ්‍යාපනයක් නොලත් වික්‍රමසිංහ ඉහළ ම බුද්ධි තලය දක්වා වර්ධනය වූයේ පොතින් හා ජීවිත තක්සලාවෙන් අහුලාගත් දැනුමෙනි.

වික්‍රමසිංහයන්ගේ සාහිත්‍ය සේවාව නවකතා නිර්මාණය, කෙටි කතා නිර්මාණ, විද්‍යාත්මක කතා, සතුන් පිළිබඳ අධ්‍යාපනය, විචාරය ආදි විවිධ තලයන් ඔස්සේ විහිදී යයි. එහෙත් ඔහු වඩා ප්‍රකට වූයේ නවකතාකරුවකු හැටියට ය. සිංහල නවකතා ඉතිහාසයේ වැදගත් ම ලේඛකයා ලෙස මාර්ටින් වික්‍රමසිංහ මහතා හැඳින්වේ. මොහු එසේ හඳුන්වන්නට හේතු වූයේ 1944 දී පළ වූ "ගම්පෙරළිය" නවකතාවෙන් මෙරට එතෙක් තිබූ නවකතා සාහිත්‍යය වෙනස් මඟකට යොමු කිරීම නිසා ය.

නවකතාවක අඩංගු විය යුතු කලාත්මක අංගයන් ද, සාර්ථක චරිත නිරූපණයක් ද, පුළුල් සමාජ දෘෂ්ටියක් සහ යථාර්ථවාදි රීතියක් ද ගම්පෙරළිය නවකතාව තුළ දක්නට ලැබුණි. ඉන් පසු ව තුන් ඈඳුතු නවකතාව සම්පූර්ණ කරමින් "කලියුගය" සහ "යුගාන්තය" බිහිවිය.

1956 දී පළ කරන ලද "විරාගය" නවකතාව වික්‍රමසිංහයන්ගේ කලාත්මක නවකතාව හැටියට විචාරකයන්ගේත් රසිකයන්ගේත් ප්‍රශංසාවට පාත්‍ර විය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් ළමා කෘති හතරක් ද, ජීව විද්‍යා කෘති හයක් ද, අතිරේක කියවීම් පොත් හතරක් ද, නවකතා දාහතරක් ද, කෙටි කතා එකොළහක් ද, නාට්‍ය හතරක් ද, "තේරි ගී" නමින් පද්‍ය කාව්‍යයක් ද, විචාර ග්‍රන්ථ විසිතුනක් ද ආදි වශයෙන් ග්‍රන්ථ රාශියක් මෙරට සාහිත්‍ය පෝෂණය කිරිමෙහිලා අපට දායක කර තිබේ.

වැඩිදුර කියවීමට :
ගත් කතුවරු : දේශීය සහ විදේශීය
පාලිත ලොකුපෝතාගම